# ව්‍යාප්ති - සැලැස්මක් සැකසීම හා අගැයීම

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි ඒ. එම්. ටී. ගුණවර්ධන විසිනි

ව්‍යාප්ති විෂයය හදරන පාසැල් ශිෂ්‍යයින්ට ප්‍රයෝජනවත් වන ලිපි පෙලක් පළ කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මෙම ලිපි පෙලෙහි අරමුණ වන්නේ කෘෂිකර්ම ව්‍යාප්ති වැඩපිළිවෙලක් (කෘෂිකර්ම ව්‍යාප්ති ව්‍යාප්ති) සම්පාදනය කිරීමේදීත්, ක්‍රියාත්මක කිරීමේදීත්, පසුව අගය කිරීමේදීත් සාමාන්‍යයෙන් අනුගමනය කරනු ලබන පිළිවෙල පිළිබඳව අවබෝධයක් ලබා දීමයි. නමුත් සෑම අවස්ථාවකම මෙහි දක්වනු ලබන අන්දමට කටයුතු කළයුතුයයි අපි නොකියමු. මෙහි දක්වෙන්නේ සාමාන්‍ය යෙන් අනුගමනය කරන මූලධර්ම පමණය. මෙම මූලධර්ම ඒ ඒ අවස්ථාවන්හි අවශ්‍යතාවයන් අනුව වෙනස් කරගත හැක.

'ව්‍යාප්තිය' යන වචනයෙන් අදහස් කරන්නේ කුමක්දැයි පළමුව සොයා බලමු. ව්‍යාප්තිය යනු (සපයනු ලබන්නා විසින්) ප්‍රයෝජනවත් වේ යැයි සිතනු ලබන තොරතුරු/අදහස් සැපයීමේ හා මග පෙන්වීමේ ක්‍රියාවලියයි. මේ අනුව බලනවිට ව්‍යාප්තිය අධ්‍යාපනික ක්‍රියාවලියකි. කෘෂිකර්ම ව්‍යාප්තිය යනුවෙන් හඳුන්වන්නේ කෘෂිකර්මයට සම්බන්ධ තොරතුරු ව්‍යාප්ති කිරීමයි.

කෘෂිකර්ම ව්‍යාප්ති කටයුත්තක ප්‍රධාන අරමුණු දෙකක් ඇත.

1. **අධ්‍යාපනික** - තමන්ගේ දැනුම හා අවබෝධය දියුණු කරලීම තුළින් (ගොවීන්ට) ඥානාන්විත තීරණ ගැනීමට උපකාර වීම;

2. **ශිල්ප ක්‍රම භාවිතය** - වැඩි දියුණු කරන ලද ශිල්ප ක්‍රම වලින් ප්‍රයෝජන යන් ලබා ගතහැකි අයට ඒවා භාවිතා කිරීමට අනුබල දීම හා උපදෙස් දීම.

කෘෂිකර්ම ව්‍යාප්ති වැඩපිළිවෙලවල් කෘෂිකර්ම (ව්‍යාප්ති ව්‍යාපෘති) වනාහී, ව්‍යාප්ති අරමුණු ඉටු කර ගැනීමට යොදා ගනු ලබන එක් මාර්ගයකි. ව්‍යාප්ති වැඩපිළිවෙලක් නම්, යම් විශේෂ ව්‍යාප්ති අරමුණු ඉටු කර ගැනීම පිණිස සකස් කරනු ලබන වැඩ කටයුතු මාලාවකි. ව්‍යාප්ති විෂයය හදරන සිසුන් එය විෂයය සඳහා කෘෂිකර්ම ව්‍යාප්ති ව්‍යාපෘති තෝරාගන ඇතිවාට සැකයක් නැත.

ඕනෑම වැඩපිළිවෙලක ප්‍රධාන අවස්ථා තුනක් වේ. එනම්, මෙහි මා ඉහත සඳහන් වන අන්දමට සම්පාදනය කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ අගය කිරීමේ අවස්ථාය. මෙම අවස්ථා තුනේ එකිනෙකට ඇති සම්බන්ධතාවය එකිනෙකින් වෙන්කළ නොහැකි අයුරින් බැඳී පවතී. කෘෂිකර්ම ව්‍යාප්ති වැඩපිළිවෙලකද වෙනත් ඕනෑම වැඩ පිළිවෙලක මෙන් මේ අවස්ථා තුන දක්නට ලැබෙයි.

වැඩ පිළිවෙලක මූලික අවස්ථා වනුයේ එහි සම්පාදනයයි. වැඩපිළිවෙල සම්පාදනය කරන අවස්ථාවේදී අපි ප්‍රධාන ප්‍රශ්න තුනකට පිළිතුරු සොයමු. ඒවා නම්, කුමක් කළයුතුද? කෙසේ කළයුතුද? සහ කොතරම් දුරට කළ යුතුද? යන්නය. ක්‍රියාත්මක කරන අවස්ථාවේදී, සම්පාදන අවස්ථාවේදී ගන්නා තීරණ ක්‍රියාවට නැගීම සිදු කෙරේ.

අගය කිරීමේ අවස්ථාවේදී ක්‍රියාවට නගන ලද එම තීරණ කොතරම්දුරට ක්‍රියාවට නැගී තිබේද, එහි බලාපොරොත්තු වූ ප්‍රතිඵල කොතරම්දුරට ඉටු වී ඇත්ද යන්න අපි නිගමනය කරමු. රූප සටහනෙන් පෙන් වන පරිදි මෙම අවස්ථා තුනේ සම්බන්ධය අවසානයක් නොමැති වෘත්තයක ස්වරූප යක් පෙන්නුම් කරයි. මෙහි අදහස නම්, නම් එක් අවස්ථාවක් අනෙක් අවස්ථාවට ඇති සම්බන්ධකමයි. සම්පාදනයෙන්, ක්‍රියාත් මක කිරීමෙන් සහ අගය කිරීමෙන් වැඩ පිළිවෙල අවසන් නොවේ. වැඩපිළිවෙලක් අගය කිරීමෙන් එය ම හෝ වෙනත් ඉදිරි වැඩපිළිවෙලක් වඩාත් හොඳින් සම්පාදනය කර ගැනීමට හැකි වනවා ඇත. මෙසේ හොඳින් සම්පාදනය කිරීම නිසා එය වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීමට හැකි වනවා ඇත. කෙටියෙන් මේ අවස්ථා තුනේ සම් බන්ධය මෙයයි.

කෘෂිකර්ම ව්‍යාප්ති වැඩපිළිවෙලක් සම් පාදනය කිරීමේදීත්, ක්‍රියාත්මක කිරීමේදීත්, අගය කිරීමේදීත් සාමාන්‍යයෙන් පිළිපදින පියවරවල් පහතින් දක්වා ඇත. මෙහි දක්වෙන පියවරවල් පසුව විස්තරාත්මකව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙමු.

## කෘෂිකර්ම ව්‍යාප්ති වැඩපිළිවෙලක අවස්ථා:

### 1. ව්‍යාප්ති වැඩපිළිවෙල සම්පාදනය

#### 1.1 තත්වය නිගමනය

(අ) ව්‍යාප්ති කටයුතු සඳහා මූලික අවශ්‍ය තාවයන් නිගමනය කිරීම;

(ආ) අවශ්‍යතාවයන් විග්‍රහ කිරීම – අවශ්‍යතා වයන්හි වැදගත්කම නිගමනය කිරීම;

(ඇ) වැදගත් අවශ්‍යතාවයන් තෝරා ගැනීම.

#### 1.2 වැඩපිළිවෙල සකස් කිරීම

(අ) වැඩපිළිවෙලේ අරමුණු තීරණය කිරීම

1. වැඩපිළිවෙලින් බලපෑමක් ඇති වන ගොවීන් තීරණය කිරීම;
2. ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන වගා කටයුතු තීරණය කිරීම;
3. ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන අදහස්/ප්‍රවෘත්ති තීරණය කිරීම;
4. ව්‍යාප්ත කිරීමේදී යොදා ගැනීමට බලා පොරොත්තු වන අධ්‍යාපනික මාර්ග යන් (ව්‍යාප්ති ක්‍රම) තීරණය කිරීම;
5. බලාපොරොත්තු වන වෙනස තීරණය කිරීම (උදා: අස්වැන්නේ වෙනසක්);
6. අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය වෙනත් කටයුතු තීරණය කිරීම (උදා: බීජ සැපයීම);
7. වැඩපිළිවෙල ක්‍රියාවට නැගෙන ආකා රය, ක්‍රියාවට නගන අය යන කරුණු තීරණය කර ගැනීම.

### 2. ව්‍යාප්ති වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම

සම්පාදනයේදී ගන්නා තීරණ ක්‍රියාවට ගැනීම

### 3. ව්‍යාප්ති වැඩපිළිවෙල අගය කිරීම–

අරමුණු කොතරම්දුරට ඉටු වී දැයි නිගමනය කිරීම, අරමුණු ඉටු වීමට හෝ නොවීමට හේතු වූ සාධක නිගමනය කිරීම, එමගින් වැඩපිළිවෙල හෝ ඉදිරි වැඩපිළිවෙලවල් සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම වැඩි දියුණු කිරීම.

ව්‍යාප්ති වැඩපිළිවෙලක ප්‍රථම හා ඉතාමත් වැදගත් අවස්ථාව එහි සම්පාදනයයි. එහි සාර්ථකත්වය බොහෝදුරට බලපාන්නේ මේ අවස්ථාව මතය. වැඩපිළිවෙලක් සම් පාදනය කිරීම පහසු දෙයක් යයි බොහෝ අය ප්‍රකාශ කළත්, එය හොඳින් සම්පාදනය කර ගැනීම ඉතාමත් බැරෑරුම් කටයුත්තක්වේ. හොඳින් වැඩ පිළිවෙලක් සම්පාදනය කර ගැනීමෙන් එය ක්‍රියාත්මක කිරීම හා අගය කිරීමද පහසු වේ. සම්පාදනය දුර්වල වූ විට ක්‍රියාත්මක කිරීම අපහසු වන අතර අරමුණු ඉටු කර ගැනීමද හොඳින් කළහැකි නොවේ.